ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018
# ගණිතය

6 ශ්‍රේණිය | කාලය පැය 2 යි

නම/ විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- I කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලැබේ.

01. 5073 යන සංඛ්‍යාවේ 7 න් නිරූපණය වන අගය ලියන්න.

02. 5, -3 යන සංඛ්‍යාවලින් සුදුසු සංඛ්‍යාව හිස්තැනට යොදන්න. (i) 2 < ----- (ii) 0 > -------

03. දී ඇති සංඛ්‍යා රේඛාවේ A, B, C, D ඉංග්‍රීසි අක්ෂර වලින් ලකුණු කර ඇති සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.




04. පෙට්ටියක ඇති පැන්සල් සංඛ්‍යාව ආසන්න 10 ගුණාකාරයට වටයූ විට 30 ක් විය. පෙට්ටියේ තිබිය හැකි අඩුම පැන්සල් ගණන කීය ද?

05. ත්‍රිකෝණ සංඛ්‍යාවක් නිරූපණය කිරීමට ඇඳ ඇති අසම්පූර්ණ තිත් සටහනක් රූපයේ දක්වා ඇත. මෙම සටහන සම්පූර්ණ කර එම ත්‍රිකෝණ සංඛ්‍යාව ලියන්න.



06. පෙ: ව: 10.30 ට ආරම්භ වූ ගණිත ප්‍රශ්න පත්‍රය ප: ව: 1.30 ට අවසන් විය. ප්‍රශ්න පත්‍රය අවසන් වූ වේලාව අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියන්න.

07. $\frac{3}{11} + \frac{2}{11}$ හි අගය සොයන්න.

08. බඳුනේ ඇති ද්‍රව ප්‍රමාණය *ml* වලින් ලියන්න.




09. රූපයේ දක්වා ඇති පතරොම භාවිතයෙන් සාදා ගන්නා සවිධි ඝන වස්තුවේ දාරයක දිග සොයන්න.




10. අවිනි ලඟ රු. 50.50 ක් ඇත. ඇය රු. 25. 75 ක් වූ පොතක් මිලට ගත්තේ නම් ඉතිරි මුදල් සොයන්න.

11. $7 \times 1 + 5 \times \frac{1}{10} + 4 \times \frac{1}{100}$ සුළු කර ලැබෙන අගය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

12. 1, 4, 9 ............... සමචතුරස්‍ර සංඛ්‍යා රටාවේ 5 වන සමචතුරස්‍ර සංඛ්‍යාව ලියන්න.

13. $\frac{3}{5} - \frac{1}{10}$ හි අගය සොයන්න.

14. 2, 3 හා 4 යන සංඛ්‍යා 3 හි ම ගුණාකාරයන් වන කුඩාම සංඛ්‍යාව ලියා දක්වන්න.

15. 5 බෙදෙන සංඛ්‍යාවල එකස්ථානය සඳහා තිබිය හැකි ඉලක්කම් මොනවා ද?

16. A කාණ්ඩය සඳහා පොදු වූ ලක්ෂණය අනුව සුදුසු නමක් දෙන්න.




17. 0.52, 0.70, 0.49 සංඛ්‍යා වලින් කුඩාම සංඛ්‍යාව ලියන්න.

18.  වර්ගඵලය 1 $cm^2$ ලෙස ගෙන රූපයේ අඳුරු කළ කොටසේ වර්ගඵලය $cm^2$ වලින් සොයන්න.



19. මෙම රූපයේ සඳහා සුදුසු සුවිශේෂී ජ්‍යාමිතික නම ලියා දක්වන්න.




20. දෙමිලියන අසූ නමය සම්මත අංකනයෙන් ලියන්න.

- පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද ලැබේ.

01. පන්ති කාමරයේ දී ඝන වස්තු නිර්මාණය සඳහා සකස් කළ පතරොම් 02 ක් පහත දැක්වේ.



(X) (Y)

(i) X හා Y පතරොම් භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තු නම් කරන්න. (ල.02)

(ii) X හා Y ඝනවස්තුවල අඳුරුකර ඇති කොටස්වල ප්‍රයෝජනයක් ලියන්න. (ල.02)

(iii) X ඝනවස්තුවේ මුහුණත්, ශීර්ෂ, දාර ගණන පිළිවෙලින් ලියන්න. (ල.03)

(iv) X ඝනවස්තුව සෑදිය හැකි වෙනත් පතරොමක් අඳින්න. (ල.02)

(b) (i) Y ඝනවස්තුවේ මුහුණත්, ශීර්ෂ හා දාර ගණන පිළිවෙලින් ලියන්න. (ල. 03)

(ii) පහත පතරොම් අතරින් Y ඝනවස්තුව සෑදිය හැකි පතරොම් තෝරා එහි අක්ෂර සඳහන් කරන්න. (ල. 04)



P Q R S T

ල. 16

02. (i) පහත දී ඇති සංඛ්‍යා යම් පොදු ලක්ෂණයක් අනුව කාණ්ඩ දෙකකට වෙන් කරමින් රවුම් 2 ක පිළිතුරු පත්‍රයේ පිටපත් කර එම රවුම් තුළ ලියා එක් එක් කාණ්ඩයට සුදුසු නම් ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | 9 | 10 | 11 |
| 12 | 13 | 14 | 15 | 16 |

..........  ..........

(ල. 04)

(ii) ඉහත වගුවේ ඇති

(a) ත්‍රිකෝණ සංඛ්‍යා සියල්ල තෝරා ලියන්න. (ල. 02)

(b) ප්‍රථමක සංඛ්‍යා සියල්ල තෝරා ලියන්න. (ල.02)

(c) සමචතුරස්‍ර සංඛ්‍යා සියල්ල තෝරා ලියන්න. (ල. 02)

(iii) ඔත්තේ සංඛ්‍යා 2 ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව සැම විටම ඔත්තේ සංඛ්‍යාවක් ද? ඉරට්ටේ සංඛ්‍යාවක් ද? (ල.01)

ල. 11

03. (a) (i) පහත දී ඇති X, Y, Z සරල රේඛීය තල රූප තුන සඳහා සුදුසු සුවිශේෂී නම් පිළිවෙලින් ලියන්න.



X Y Z (ල.03)

(ii) ත්‍රිපීසියමක රූප සටහනක් ඇඳ එහි ලක්ෂණයක් ලියන්න. (ල. 02)

(b) (i) රූපයේ පරිමිතිය සොයන්න.



5cm 3mm

10 cm 4mm

(ල. 02)

(ii) සමාධි ළඟ රතු පාට රිබන් 1 1/2 m ක් ද, නිල් පාට රිබන් 75 cm ද කොළපාට රිබන් 1m 45 cm ද ඇත. ඇය ළඟ වැඩියෙන්ම ඇති රිබන් පටියේ වර්ණය කුමක් ද? (ල. 02)

(iii) මීටර් 1.35 , සෙන්ටිමීටර් වලින් දක්වන්න. (ල. 02)

ල. 11

04. (i) අඳුරු කළ කොටස භාගයක් ලෙස ලියන්න. (ල.02)



(ii) ඒකක භාග 02 ක් ලියන්න. (ල. 02)

(iii) හිස් කොටුවලට සුදුසු සංඛ්‍යා යොදන්න.

$$\frac{2}{5} = \frac{2 \times \ }{5 \times 3} = \frac{\square}{\square}$$ (ල. 03)

(iv) >, <, = සංකේත සුදුසු පරිදි හිස්තැන් සඳහා යොදන්න.

(a) $\frac{1}{5}$ ...... $\frac{3}{5}$

(b) $\frac{2}{7}$ ...... $\frac{2}{9}$

(c) $\frac{2}{3}$ ...... $\frac{4}{6}$

(d) $\frac{1}{2}$ ...... $\frac{3}{4}$ (ල. 04)

ල. 11

05. (a)




(i) කුඩ රෙද්ද අලංකාර කිරීම සඳහා භාවිතා කළ සංඛ්‍යා සියල්ල ලියන්න. (ල. 02)

(ii) කුඩයේ මිට සඳහා ද 1 - 25 අතර එක්තරා සංඛ්‍යාවක සියලු සාධක භාවිතා කර රූපයේ පෙන්වා ඇති ලෙස රවුම් තුළ සාධක යෙදුවාය. ඇය සාධක ලිවීමට යොදා ගත් සංඛ්‍යාව කුමක් ද? (ල. 02)

(iii) ඇය 25 ට අඩු 5 න් බෙදෙන විශාලම සංඛ්‍යාව (A) අක්ෂරය ඇති ස්ථානයට යෙදුවාය. එම සංඛ්‍යාව කුමක් ද? (ල. 02)

(iv) 19 හි සියලු සාධක ලියන්න. (ල. 02)

(b) (i) පොත් 20 ක් එකම පාර්සලයක හෝ සෑම පාර්සලයකම සමාන සංඛ්‍යාවක් ඇතුළත් වන සේ පාර්සල් කළ යුතුයි. පොත් 20 පාර්සල් කළ හැකි ආකාර කීයක් තිබේ ද? (ල. 03)

ල. 11

06. (i) 2.32 යන දශම සංඛ්‍යාව කියවන ආකාරය ලියන්න. (ල. 02)

(ii) දී ඇති භාග සංඛ්‍යා, දශම සංඛ්‍යා ලෙස ලියා දක්වන්න.

(a) $\frac{7}{10} =$

(b) $\frac{11}{100} =$ (ල. 03)

(c) $\frac{2}{5} =$

(iii) අගය සොයන්න.

$$\begin{array}{r} 4\ .\ 7 \\ +\,3\ .\ 5 \\ \hline \\ \hline \end{array}$$

(ල. 02)

(iv) දී ඇති දශම සංඛ්‍යා ගණක රාමු මගින් නිරූපණය කරන්න. (ල. 04)

(i) 12.3



(ii) 4 . 21



ල. 11

07. (a)

> සහන්, නිවසේ තිබූ මාළු ටැංකියේ සිටි මාළුවෙකු සරල දාරයක් භාවිතයෙන් නිර්මාණය කළේය. එය දුටු 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන දෙව්මි, " අයියේ, අද අපේ ටීචර් කෝණ පාඩම ඉගැන්වූවා යි" පවසමින් a, b, c, d ලෙස රූපයේ කෝණ 4 ක් ලකුණු කළාය.




දෙව්මි රූපයේ ලකුණු කර ඇති කෝණ හඳුනා ගනිමින් වරහන් තුළ නිවැරදි අක්ෂර යොදන්න.

(i) සුළු කෝණය ( )

(ii) සෘජු කෝණය ( )

(iii) මහා කෝණය ( )

(iv) පරාවර්ත කෝණය ( ) (ල. 04)

(b) X ස්ථානයෙන් ගමන් ආරම්භ කළ ජයනී, 25 m ක් නැගෙනහිර දෙසට ගමන් කර Y හි නතර විය. නැවත එතැන් සිට 25 m ක් ඊසාන දෙසට ගමන් කර Z හි නැවතුනාය.

(i) ඉහත තොරතුරු දළ සටහනක දක්වන්න. (ල. 02)

(ii) ඉහත සටහනට අනුව Y පිහිටියේ Z ට කුමන දිශාවකින් ද? (ල. 02)

(iii) කිසියම් ස්ථානයක සිට දිශා නිවැරදි ව සොයා ගැනීමට භාවිතා කරන උපකරණයේ නම ලියන්න. (ල. 01)

(c) ජලය 2 *l* ක් පිරවිය හැකි වතුර බෝතලයක ජලය 1 *l* 75 *ml* ඇත. මෙම බෝතලය සම්පූර්ණයෙන් පිරවීමට තව කොපමණ ජලය දැමිය යුතු ද? (ල. 02)

ල. 11